# ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාව

**බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය**
**බෞද්ධ අධ්‍යයන පීඨය**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය**
**අනුරාධපුරය**

## පාඨමාලාවේ ස්වභාවය, බඳවා ගැනීමේ පටිපාටිය හා ප්‍රවේශ පරීක්ෂණය පිළිබඳ විස්තර

## 01. පාඨමාලාවේ ස්වභාවය

මෙය වසර හතරක සමාසික අටකින් සමන්විත න්‍යායාත්මක හා ප්‍රායෝගික අධ්‍යයනයකින් යුක්ත ගෞරව උපාධි පාඨමාලාවකි.

ථෙරවාද ත්‍රිපිටකය, අටුවා හා ටීකා ඇසුරින් අධ්‍යයනය කිරීම මෙම පාඨමාලාවේ ප්‍රධාන කාර්ය යි. සමාසික දෙක බැගින් වූ අධ්‍යයන වර්ෂයක් තුළ සූත්‍ර, විනය හා අභිධර්මය යන ත්‍රිපිටකයේ කොටස් අට්ඨකථා හා ටීකා ආශ්‍රයෙන් විෂයය පත්‍ර වශයෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. එසේම මහාවිහාරයීය බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය වන සජ්ඣායනා කිරීම, වාචෝද්ගත කිරීම සහ ප්‍රායෝගික භාවිතය ද මෙම අධ්‍යයනයට ඇතුළත් වේ. ත්‍රිපිටකය ආශ්‍රයෙන් ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම සිව්වන වසර ශිෂ්‍යයන් සඳහා අනිවාර්ය වේ.

මීට අමතරව සෑම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක්ම ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය වසර හතර තුළදීම අනිවාර්යෙන් හැදෑරිය යුතුය.

එසේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF/NVQ) අනුව මූලික අධ්‍යාපනය සම්පූර්ණ නොකළ භික්ෂූන් වහන්සේලාට පවා ක්‍රමානුකූලව උසස් අධ්‍යාපනය කරා ගමන් කිරීමේ අවස්ථාව මේ තුළින් උදා කර ගත හැකිය.

## 02. බඳවා ගැනීමේ පටිපාටිය

මෙම පාඨමාලාවට විද්‍යාර්ථීන් බඳවා ගැනීමේ දී පහත නිර්ණායක ප්‍රධාන වශයෙන් සලකා බලනු ලැබේ.

1. අපේක්ෂකයා 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් පනතේ 41 වන වගන්තිය යටතේ සඳහන් පරිදි භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ලියාපදිංචි වී සිටිය යුතු ය (සාමණේර හෝ උපසම්පදා භික්ෂුවක් විය යුතුය). (විදේශීය සිසුන් සඳහා මෙය අදාළ නොවේ.)
2. අපේක්ෂකයා ඉල්ලුම් පත්‍ර යොමු කරන දිනට වයස් සීමාව අවුරුදු 18 නො අඩු විය යුතුය.

## 03. අධ්‍යාපන සුදුසුකම්

1. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන ප්‍රාරම්භ හෝ ඉන් ඉහළ විභාගයක් සමත් වී තිබීම

   **හෝ**

2. ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී 30 % කට නො අඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම

   **හෝ**

3. බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත හෝ බෞද්ධ අධ්‍යයන විෂයයන් යටතේ SLQF 03 සහ 04 / NVQ 5 සහ 6 ස්තරවලට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

   **හෝ**

4. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

සැ.යු :- මෙම උපාධි පාඨමාලාවට අයදුම් කරන ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සමත් අයදුම්කරුවන් හැර සෙසු සියලු ම අයදුම්කරුවන් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගෙන් උපාධි පාඨමාලාව සඳහා අපේක්ෂිත ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ප්‍රමාණය තෝරාගනු ලැබේ. ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සමත් අයදුම්කරුවන් ප්‍රවේශ පරීක්ෂණයෙන් නිදහස් කර පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ. (ඒ ඒ අධ්‍යයන වර්ෂවල බඳවා ගන්නා කඩඉම් ලකුණ විශ්වවිද්‍යාලය මගින් තීරණය කරනු ලැබේ.)

## 04. ප්‍රවේශ පරීක්ෂණය

ප්‍රවේශ පරීක්ෂණය සඳහා ප්‍රශ්න අටකින් යුත් ප්‍රශ්න පත්‍රයක් ලබාදෙන අතර එයින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය. ඒ සඳහා කාලය පැය තුනක් ලබාදෙන අතර ලකුණු 100 ක් පිරිනැමේ. ත්‍රිපිටක ඥානය, සිංහල ලේඛන කුශලතා සහ බහුවරණ යනුවෙන් කොටස් තුනක් යටතේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. කොටස් තුනෙන් එක කොටසකින් අවම එක් ප්‍රශ්නයක් තෝරා ගැනීම අනිවාර්ය වේ. (ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සමත් සිසුන් ප්‍රවේශ පරීක්ෂණයෙන් නිදහස් වේ.)

### ත්‍රිපිටක ඥානය (ලකුණු 60 යි)

සූත්‍ර පිටකය- දසධම්ම, මහාමංගල, සිඟාලෝවාද හා ධම්මචක්කපවත්තන යන සූත්‍ර ධර්මයන්හි එන බුදුදහම, භික්ෂු ජීවිතය හා සමාජ සංවර්ධනයට අදාළ කරුණු පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. (ලකුණු 20 යි.)

- අංගුත්තරනිකාය, දසක නිපාත, අක්කෝස වග්ග, දසධම්ම සුත්ත, බු.ජ. ත්‍රි. මු. 2015.

- අංගුත්තරනිකාය, සුත්තනිපාත, චූල්ල වග්ග, මංගල සුත්ත, බු.ජ. ත්‍රි. මු. 2015.
- දීඝනිකාය, පාථික වග්ග, සිඟාල සුත්ත, බු.ජ. ත්‍රි. මු. 2015.
- සංයුත්තනිකාය, සච්ච සංයුත්තය, ධම්මචක්කපවත්තන සුත්ත, බු.ජ. ත්‍රි. මු. 2015.

විනය පිටකය - දසසිඛ දස පරිජි, දසනාසනා, සතර පරිජි තෙළෙස් සඟවෙසෙස්, අනියත, නිසගි පචිති, සේඛියා යන විනය කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුමක් අපේක්ෂා කෙරේ. (ලකුණු 20 යි)

- පාරාජිකපාළි I, සතර පාරාජිකාපත්ති (28-236), බු.ජ. ත්‍රි. මු. 2015.
- පාරාජිකපාළි I, තෙළෙස් සඟවෙසෙස් (256-478), බු.ජ. ත්‍රි. මු. 2015.
- පාරාජිකපාළි I, අනියත (484-492), බු.ජ. ත්‍රි. මු. 2015.
- පාචිත්තියපාළි I, පචිති (02-463), බු.ජ. ත්‍රි. මු. 2005.
- පාචිත්තියපාළි I, සේඛියා (464-553), බු.ජ. ත්‍රි. මු. 2005.
- ඛුද්දකපාඨපාළි, දසසික්ඛාපද, බු.ජ. ත්‍රි. මු. 2015.
- පියරතන හිමි, අත්තුඩාවේ, *සාමණේර බණ දහම් පොත,* ඇස්. ගොඩගේ සහ සමාගම, කොළඹ, 1991.
- ධම්මපරායනතිස්ස හිමි, බූජ්ජම්පොල, *ප්‍රාතිමෝක්ෂ විවරණ*, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 1996.
- විජිතධම්ම හිමි, මැදගම්පිටියේ, *බෞද්ධ විනය කර්ම*, සදීපා ප්‍රකාශන, කොළඹ, 2006.

අභිධර්ම පිටකය - අභිධර්මාර්ථ සංග්‍රහයේ සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුමක් අපේක්ෂා කෙරේ. (ලකුණු 20 යි.)

- *අභිධර්මාර්ථ සංග්‍රහය,* (සංස්.) රේරුකානේ චන්දවිමල හිමි, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට, 2013.
- චන්දවිමල හිමි, රේරුකානේ, *අභිධර්මයේ මූලික කරුණු,* ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට, 2021.
- ඤාණසීහ හිමි, හේන්පිටගෙදර. *අභිධර්ම පරීක්ෂණය,* සමයවර්ධන පොත්හල, කොළඹ, 2009.

**සිංහල ලේඛන කුසලතා (ලකුණු 20 යි)**

සිංහල වාක්‍ය රචනය, උක්තාඛ්‍යාත යෝගය, සාරාංශකරණය ආදි මූලික සිංහල ලේඛන රචනෝපක්‍රම පිළිබඳ සාමාන්‍ය දැනුමක් අපේක්ෂා කෙරේ.

- ඉන්දසේන, ඩී. ඒ., *ප්‍රායෝගික සිංහල ව්‍යාකරණය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 2006.

- ගුණානන්ද හිමි, වැයිහේනේ, *සිංහල ව්‍යාකරණ සංග්‍රහය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1995.
- දිසානායක, ජේ.බී., *භාෂාවක භාවිතය හා විග්‍රහය*, ස්ටැම්ෆර්ඩ් ලේක්, පන්නිපිටිය, 2003.


**බහුවරණ (ලකුණු 20 යි)**

බෞද්ධ සාහිත්‍යය, බෞද්ධ සංස්කෘතිය, ඉන්දු හා ලංකා ඉතිහාසය හා නූතන සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම පිළිබඳ සාමාන්‍ය දැනුමක් අපේක්ෂා කෙරේ.


- හෙට්ටිආරච්චි, කුමාරදාස, *සාමාන්‍ය දැනීම*, ඇස්. ගොඩගේ සහ සමාගම, කොළඹ, 1999.
- හෙට්ටිආරච්චි, නිමල්, *සාමාන්‍ය දැනීම - ලංකාව හා ලෝකය*, නවෝදය ප්‍රකාශන, බොරලැස්ගමුව. 1995.
- රාජපක්ෂ. ආර්. එම්. එස්., *අධ්‍යාපන සාමාන්‍ය දැනීම*, කර්තෘ ප්‍රකාශන, කැකිරාව, 2015.